

# හොඳ සිංහල



## වි ක ධර්මබන්ධු

සිරිත් පරිදි අදත් පසුගිය පාඩමේ වැකි පහ විමසා බලමු.

1. මමත් තාත්තාත් අම්මාත් පන්සලට ගියෝ ය.

මෙහි අවසාන ක්‍රියාව වන්නේ 'ගියෝ ය' ය. උක්තය වන්නේ මමත් තාත්තාත් අම්මාත් (යන අප තිදෙනා) ය. 'අපි පන්සල් ගියා, පන්සලට ගියේ අපි තුන්දෙනා' යනුවෙනි අනෙකකුට අප පවසන්නේ 'ගියෝය' යනු අන්‍යපුරුෂ බහු වචන (ඔහු/ ඔව්හු) සඳහා යෙදිය යුතු ආඛ්‍යාතයකි. එහෙයින් මේ වැකියේ ආඛ්‍යාතය (අපි) 'ගියෙමු' විය යුතුය.

2. මම තාත්තාත් අම්මාත් සමඟ පන්සලට ගියෝ ය.

මේ වැකියේ හැටියට, තාත්තාත් අම්මාත් සමඟ (එක්ව, කැටිව, කැඳවා ගෙන) පන්සලට ගියේ " මම" ය. එහෙයින් මේ වැකියේ උක්තය වන්නේ " මම" ය්. උක්තය "මම" නිසා ආඛ්‍යාතය 'ගියෙමි' විය යුතුය.

3. මා සමඟ තාත්තාත් අම්මාත් පන්සලට ගියෝ ය.

අප තිදෙනාම පන්සල් ගිය බව සැබවි. එහෙත් මා පන්සලට කැඳවා ගෙන ගියේ තාත්තාත් අම්මාත් යන දෙදෙනා ය. මෙහි උක්තය වන්නේ 'ඔහු දෙදෙනාය' 'ඔහු දෙදෙනා ගියෝය' යන වැකිය ඒ නිසා නිවැරදිය.

4. මමත් අම්මාත් සමඟ තාත්තා පන්සලට ගියේය.

'තාත්තා පන්සලට ගියේය' යන්න නිවැරදිය. ඔහු එහි ගියේ මාත් අම්මාත් සමඟ ය. එහෙයින් මාත් අම්මාත් අනුක්ත රූපයෙන් තිබිය යුතුය. 'අම්මා' අනියමිත් යෙදුණු නිසා උක්ත - අනුක්ත රූප වෙනස් නොවේ. 'මම' අනුක්ත වන්නේ 'මා' යනුවෙනි. එනිසා එම වැකිය 'මාත් අම්මාත් සමඟ තාත්තා පන්සලට ගියේය' යනුවෙන් සකස් විය යුතුය.

5. මා අම්මාත් තාත්තාත් සමඟ පන්සලට ගියේය.

මේ වැකියේ අරමුණ මා පන්සලට ගිය බව කීමය්. මා එහි ගියේ තනිවම නොවේ, අම්මාත් තාත්තාත් සමඟය. මා ගියේ ය යන වැකියේ 'මා' උක්ත රූපය ගත යුතුය. "මම ගියේය" ද වෙනස් විය යුතු ය. එවිට එම වැකිය "මම අම්මාත් තාත්තාත් සමඟ පන්සලට ගියෙමි" යනුවෙන් සකස් විය යුතුය.

ඔබ ගණිතය, ගණනය, ගණක රාමුව ගැන දනිති. එහි ඇත්තේ අල්ප ප්‍රාණ 'ග' යන්නත්, මූර්ධජ 'ණ' යන්නත්ය. එහෙත් ඔබ 'පරිඝනකය' ගැන කියති. ලියති, 'ගණකය' යන පදයට 'පරි' යන උපසර්ගය එක් වී පරිගණකය සැදෙය්. න/ණ, ල/ළ භේදය නොතකා ලියන කෙනකුට 'පරිගනකය' යනුවෙන් ලිවිය හැකිය. සම්මත විදියට නම් 'පරිගණකය' යනු නිවැරදි පදයය්. ගණි, ගණිති, ගණිමි, ගණිමු ආදී වශයෙන් වරනැගෙන 'ගණ' ධාතුවෙන් ගණුව, ගණනය වැනි නාම පදයක් සදා ගෙන එය 'පිරි' යන උපසර්ගයත් සමඟ 'පිරිගණුව, පිරිගණනය' වැනි පදයක් වුවද සාදා ගත හැකිය. එහෙත් අප හුරු පුරුදු වී ඇත්තේ සකු මුහුණුවර ඇති පදවලටය්.

පරිශුද්ධ = පිරිසුදු = පිරිසිදු, පරිකර්ම = පිරිකම් =

*ඔබ ගණිතය, ගණනය, ගණක රාමුව ගැන දනිති. එහි ඇත්තේ අල්ප ප්‍රාණ 'ග' යන්නත්, මූර්ධජ 'ණ' යන්නත්ය. එහෙත් ඔබ 'පරිඝනකය' ගැන කියති. ලියති, 'ගණකය' යන පදයට 'පරි' යන උපසර්ගය එක් වී පරිගණකය සැදෙය්. න/ණ, ල/ළ භේදය නොතකා ලියන කෙනකුට 'පරිගනකය' යනුවෙන් ලිවිය හැකිය.* ***සම්මත විදියට නම් 'පරිගණකය' යනු නිවැරදි පදයය්.***

*'අභියස' යනුත් විමසිය යුතු වචනයකි. නිවැරදි පදය වන්නේ 'අබියස' ය.*

පිරියම්, යන වචන දෙස බලා 'පරි' යන සකු උපසර්ගය ම 'පිරි' යනුවෙන් සිංහලට බිඳෙන සැටි ඉගෙන ගන්න.

'අභියස' යනුත් විමසිය යුතු වචනයකි. 'අභි' යන සකු උපසර්ගය සිංහලට බිඳෙන්නේ 'අබි' යනුවෙනි. ශුද්ධ සිංහලයට මහා ප්‍රාණ අකුරුත් ෂ, ශ, ඛ, ඤ පද යන අකුරුත් නැත. ධන/දන, ඵල/පල, භය/බිය, ඝන/ගන යන වචන දෙස බලන්න. අභිමාන/අබිමන්, අභිශේක/අබිසෙස්, අභිධර්ම/අබිදම් යන වචන ගැනත් සිතන්න. අභියස = අභිඅස යන පද දෙකේ මුල් පදය 'සකු' ය. අග පදය ශුද්ධ සිංහල (එළු) ය. ඛණප්‍රස්තකය, ක්ෂීර සයුර වැනි වචනවල ඇදය ඔබට පෙනෙතැය් සිතමි. ඒ නිසා නිවැරදි පදය වන්නේ 'අබියස' ය. 'අස' යනු සමීපය. ළඟ යන තේරුම ඇති පදයකි. 'අසූල = අසල, කොරූල = කොරල යන දෙපදය විමසන්න. ('ල' යනු තද්ධිත ප්‍රත්‍යයක් විය හැකිය.)

අද අපි අපේ අලුත් වැකි පහ ඉගෙන ගනිමු. ඒ සඳහා මා තෝරා ගත්තේ ගීත ඛණ්ඩ පසකි.

1. 'එක මවෙකුගෙ දරු කැල බැවිනා. යමු යමු වී නොපමා.
2. 'සෝබන චන්ද්‍රා, නැඟ එනවා. චන්ද්‍රාවෝ ඔබ සිහිවෙනවා'
3. 'පැමිණිලිකරුවොය් වැරදි කාරයෝ විත්තිකාරයෝ නිදහස්'
4. 'අපේ අම්මා් මට හරි ම ආදරෙය් මාය් ඇගේ එක දරුවා. කසාදයක් මට බඳින්න කියලා නිතරම කරදර කෙරුවා!!
5. දෙව්යෙක් වාගෙ මෙයා ආවා නේ මාව සොයා...... කදිමට නුඹට මමත් මම නුඹටත් මැච් වෙනවා.'

පසුගිය අභ්‍යාස දෙක ඔබට ප්‍රයෝජනවත් වන්නට ඇතැය් සිතමි. සිනා සිසී මේ අභ්‍යාසයත් කරන්න. පිළිතුරු ලබන කලාපයේ.

